සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **33 S I**

## ඉතිහාසය - I

**කාලය පැය එකයි**

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
★ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

1. පුරා විද්‍යා කැනීම් හා පර්යේෂණ මඟින් සොයා ගැනෙන පුරා වස්තු, ස්මාරක, කාසි, ශිලා ලිපි හා විවිධ නටඹුන් ආදිය අයත් වන්නේ,
   1. සාහිත්‍ය මූලාශ්‍රය 2. පුරා විද්‍යාත්මක මූලාශ්‍රය 3. අභිලේඛන මූලාශ්‍රය 4. ඓතක මූලාශ්‍රය

2. මෙරට ශාසන ඉතිහාසය පිළිබඳව ලිය වී ඇති ග්‍රන්ථය වන්නේ මින් කුමක්ද?
   1. නිකාය සංග්‍රහය 2. රාජාවලිය 3. ප්‍රශස්ති කාව්‍ය 4. සන්දේශ කාව්‍ය

3. A තීරුව හා B තීරුව ගලපා නිවැරදිව යාකොට පිළිතුර සොයන්න.

| A | B |
|---|---|
| 1. රන් තහඩුවකි | A. ඩිමුන්ඩෝ කෘතිය |
| 2. රෝම මූලාශ්‍රයකි | B. වල්ලිපුරම් අභිලේඛනය |
| 3. ග්‍රීක මූලාශ්‍රයකි | C.නැචුරාලිස් හිස්ටොරියා |
| 4. තඹ තහඩුවකි | D.පනාකඩුව අභිලේඛනය |

1. BCAD 2. BCDA 3. DABC 4. ADBC

4. අධික වර්ෂාපතනය සහිත කාලගුණය නිසා කඳුකර ප්‍රදේශ සෝදා යාම සිදු වුයේ පහත සඳහන් කුමන කාලයේදී ද?
   1. ප්ලයිස්ටෝසීන භූ අවධියේ දීය. 2. හොලෝසීන යුගයේ දීය.
   3. මුල් ඓතිහාසික යුගයේ දීය. 4. වැඩවසම් යුගයේ දීය.

5. ප්‍රාග් ඓතිහාසික යුගයේ තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ,
   1. සීගිරි පොතානය. 2. පාහියන්ගල ලෙනය. 3. හෝර්ටන් තැන්නය. 4. බෙල්ලන් බැඳි පැලැස්සය.

6. A තීරුවේ හා B තීරුවේ තොරතුරුවල සම්බන්ධතාවය ගලපමින් නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. තිස්සමහාරාම වලගම්පත්තුව | A. පනාකඩුව තඹ සන්නස |
| 2. උඩ රංචාමඩම | B. නවා වකුටුකර මිනී වැළලීම |
| 3. කුරුවිට බටදොඹ ලෙන | C. පූර්ව ඓතිහාසික යුගයේ නිවාස තැනීම |
| 4. නුරුපුර | D. මුල් ඓතිහාසික යුගයේ නිවාස තැනීම |

1. DCAB 2. CADB 3. ACBD 4. DCBA

7. පූර්ව රාජ්‍ය සමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය සඳහන් කරන්න.
   1. පූර්ව රාජ්‍ය සමයේදී මෙරට පාලනය කිරීමට එක් නිශ්චිත පාලකයෙකු සිට ඇති බව සෙල්ලිපි වල සඳහන් වේ.
   2. වැඩි දෙනෙකුගේ එකඟතාවයෙන් රට පාලනය කිරීම මෙකල සිදු විය.
   3. නිශ්චිත පාලකයෙක් නොමැති අතර ඒ වෙනුවට කුඩා කුඩා ප්‍රදේශ වල සිය බලය පවත්වාගෙන යන ලද්දේ වත් පොහොසත්කම් ඇති පුද්ගලයන්ය.
   4. පරුමක වරුන්ට අයබදු ලබා ගැනීම හා දේපළ භුක්ති විඳීමට අයිතියක් නොතිබුණි.

8. ගෘහපතින් අතරින් ගමිකයෙකු තෝරාගත් බව බුද්ධඝෝෂ හිමියන් පවසන්නේ,
   1. පූජාවලියේය. 2. සමන්ත පාසාදිකාවේය. 3. ජාතකට්ඨකතාවේය. 4. කොත්ගල් කන්ද සෙල්ලිපියේය.

9. "උපසග්ග රෝග නාසා"නමින් උණ රෝගය සඳහා ප්‍රතිකාර කළ හැකි වෙනම රෝහලක් ඉදි කළ රජතුමා පහත සඳහන් අය අතරින් කවුරුන්ද?
   1. පස්වන මිහිඳු රජුය. 2. හතරවන කාශ්‍යප රජුය. 3. බුද්ධදාස රජුය. 4. පළමුවන උපතිස්ස රජුය.

10. මෙරට පැරණි සමාජයේ හේන් ගොවිතැන සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය මින් කුමක්ද?
    1. හේන් වලින් අය කළ බදු නිදහස් කළ රජතුමා වන්නේ පළමුවන උපතිස්සය.
    2. බුත්සරණ නම් ග්‍රන්ථයේ හේන "සෙහෙන්" යන නමින් හඳුන්වා ඇත.
    3. උම්මග්ග ජාතකයේ හේන "සෙන්" යනුවෙන් හඳුන්වා ඇත.
    4. කැති අඩ සහ කෙටුකනබ සෙහෙන් වලින් අය කළ බදුය.

11. A අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩදිය නොහැකිය.
B වෙගිරියේ දේවාලය අසල පිහිටි සෙල්ලිපියක දටික සුමණ නම් වූ පුද්ගලයෙකු ගැන සඳහන් වේ.
C දකුණු පළාතේ පිහිටි බෝවත්තේගල නම් ස්ථානයේ ඇති සෙල්ලිපියක "කබොජ මහ පුගිය" යන යෙදුම ඇත.
D "ලපන" යන නාමය අතීත කලා කරුවන් භාවිත කිරීම දක්නට ලැබේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් මහා පරාක්‍රමබාහු රජු ගැන සඳහන් වන පාඨය හා සුලු කර්මාන්ත ගැන සඳහන් පාඨය වන්නේ,

1. A හා C ය    2. A හා B ය    3.C හා D ය    4. A හා D ය

12. පහත සඳහන් කර ඇති තොරතුරු යුගල අතරින් එක් යුගලයක් අසත්‍ය වේ. එම යුගලය මින් කුමක්ද?

1. බ්‍රාහ්මණයින් ආගමික කටයුතු කරන ස්ථානය - සොත්ථි ශාලා
2. මාතොට වරාය - තිරුකේතිස්වරම් කෝවිල
3. සිවිකා ශාලා - ශිව ලිංගය පිහිටුවා තිබූ ස්ථානය
4. මුන්නේෂ්වරම් කෝවිල - ගෝකණ්ණ වරාය අසල

13. පැරණි විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

1. නව සොයාගැනීම් තුලින් ගුණාත්මකවත් ප්‍රමාණාත්මකවත් නිෂ්පාදන බිහි කළ හැකිය.
2. ස්වභාවධර්මයේ ක්‍රියාකාරීත්වයට බල පවත්වන මූලධර්ම හඳුනාගෙන මේවා තුළින් ප්‍රායෝගිකව වැඩ පහසු කර ගැනීමට යොදාගන්නා උපක්‍රම තාක්ෂණය වේ.
3. වසර 3250 කට පෙර ඉදිකරන ලද මැටි ඔරු සුසාන තුළ කිසිදු විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රම දක්නට නොලැබේ.
4. පැරැන්නන් ස්වභාවික සුළං බලය මගින් යකඩ නිස්සාරණය කළද යකඩ නිස්සාරණයට වෙනත් ක්‍රම ගැන ඔවුන් දැන සිටියේ නැත.

පහත තොරතුරු ආශ්‍රායෙන් 14 හා 15 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A සතර් රියන් දියට් හිඳවූ දියගැට පහන්.
B භික්ෂුන්ගේ අවශ්‍යතා සඳහා ඉදි වුවෙකි.
C නියමිත ප්‍රමිතිය සහ සිසිලනය ආරක්ෂා කර ගැනීම සඳහා තාක්ෂණයක් තිබුණි.
D කටුගහ ගල්ගේ සහ වැලිගත්ත යන ප්‍රදේශ වලින් ගාවුත කණු සොයාගෙන ඇත.

14. වෙස්සගිරිය සෙල්ලිපියේ තොරතුරු හා කුට්ටම් පොකුණ සම්බන්ධ තොරතුරු අඩංගු වන්නේ,

1. A හා C ය    2. A හා D ය    3. B හා D ය    4. A හා B ය

15. උෟරා කැට ලිං හා දුර මැනිම සම්බන්ධ ප්‍රකාශ අයත් පිළිතුර මින් කුමක්ද?

1. A හා C ය    2. A හා D ය    3. C හා D ය    4. B හා C ය

16. රජතුමාට අයත් ඉඩම් වල වගා කිරීමෙන් අයකර ගන්නා බදු වර්ගය හඳුන්වනු ලබන්නේ,

1. දකපති    2. බොජක පති    3. මතර මජිබක    4. කැති අඩ

17. අඹු, හඹු, කාඩි, යවාගු යන නම් වලින් පැරැන්නන් හඳුන්වා ඇත්තේ,

1. කුලු බඩු වර්ගය    2. කැඳය    3. තල ගුලිය    4. හොදි වර්ගය

● පහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් 18 වන ප්‍රශ්නයට පිළිතුරු සොයන්න.

A ලීලාවතී දේවිය
B අශෝකමාලා දේවිය
C තලතා ලක්ෂ්මි නම් කාන්තාව
D විහාරමහා දේවිය
E චූල සීවලි දේවිය

මෙරට තෙවරක් බලයට පත් කාන්තාව, මදුපාචිකා යන නාමය භාවිතයට සුදුසු කාන්තාව සහ තම පෞද්ගලික ධනය බෞද්ධ විහාරයට පුජා කළ කාන්තාව සඳහන් අක්ෂර පිළිවෙලින්,

18. 1. AB හා E ය    2. AB හා C ය    3. BC හා D ය    4. AD හා E ය

19. පහත A B C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතරින් ඉබන් බතුතාට අසන්නට නොලැබෙන සිදුවීම් ඇතුළත් පිළිතුර මින් කුමක්ද?

A චෙන්හෝ සෙන්පතියාගේ පැමිණීම
B චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය
C කාලිංග මාඝගේ පැමිණීම
D සපුමල් කුමරු යාපනය ජය ගැනීම

1. A හා C ය    2. A හා D ය    3. B හා D ය    4. B හා C ය

20. ගම්පොල යුගය හා සම්බන්ධ නොවන ප්‍රකාශය මින් කුමක්ද?
1. ප්‍රභූ පවුල් දෙකක් සිටීම. 2. මයුර හා තිසර සංදේශ ලියවීම.
3. ජාතක කථා පොත සිංහලයට පරිවර්තනය කිරීම. 4. විදේශ සංචාරකයින් දෙදෙනෙකු පැමිණීම.

පහත තොරතුරු ආශ්‍රයෙන් 21 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A දඹදෙනිය B යාපහුව C කෝට්ටේ D මහනුවර E ගම්පොල

21. ඉහත රාජධානි අතර මලය දේශයට අයත් රාජධානි දෙක වන්නේ මින් කුමක්ද?

1. A හා E ය 2. C හා D ය 3. D හා E ය 4. B හා D ය

22. පැරණි මහනුවර නගර සැලැස්මේ නොමැති දෙයකි,
1. මහනුවර මගුල් මඩුව 2. විශ්ණු දේවාලය 3. මල්වත්ත විහාරය 4. පිට දිය අගල

23. ක්‍රි.ව. 1766 දී ලන්දේසින් සමඟ ගිවිසුමේ අත්සන් කරන ලද මහනුවර පාලකයා වන්නේ,
1. ශ්‍රී විජය රාජසිංහ රජු 2. කිර්තී ශ්‍රී රාජසිංහ රජු 3. රාජධි රාජසිංහ රජු 4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

24. පුනරුද සමයේ ඉතාලියේ සිටි ගත් කතුවරයෙකු නොවන්නේ මින් කවුරුන්ද?
1. අලගියරි ඩාන්ටේය. 2. පෙට්රාක්ය. 3. බොකෑෂියෝය. 4. සර් තෝමස් මුවර්ය.

25. පුනරුද සමයේ සිටි ගෘහ නිර්මාණ ශිල්පියෙකු නොවන්නේ පහත සඳහන් පුද්ගලයන්ගෙන් කවුරුන්ද?
1. මයිකල් ආන්ජලෝය. 2. ලියනාඩෝ ඩාවින්චිය. 3. රෆායල්ය. 4. ජොහැන්නස් කෙප්ලර්ය.

පහත තොරතුරු ආශ්‍රයෙන් 26 හා 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>මිසරය | B<br>ඉස්තාන්බුල් | C<br>පර්සියාව | D<br>පේරෝ ලොපේද සුසා | E<br>නාවික හෙන්රි |
| F<br>කැලිකට් | G<br>ලොරන්සෝද අල්මේදා | H<br>වස්කෝද ගාමා | I<br>රන්දෙණිවෙළ සටන | J<br>දියෝගෝද මේලෝ කැස්ත්‍රෝ |

26. 1498 දී ඉන්දියාවට පැමිණි පෘතුගීසි ජාතිකයා සහ ඔහු ගොඩබස්නා ලද ස්ථානය වන්නේ,
1. G හා A 2. H හා C 3. H හා F 4. J හා F

27. මෙරටට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා, පෘතුගීසි නායකයා සහ දන්තුරේ සටන මෙහෙයවූ පෘතුග්‍රසි නායකයා සඳහන් වන නිවැරදි අක්ෂර වන්නේ,
1. H හා J ය. 2. G හා D ය. 3. E හා H ය. 4. G හා J ය.

28. කාර්මික විප්ලවය එංගලන්තයේ ඇති වීමට හේතුවක් නොවන්නේ මින් කුමක්ද?
1. ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය 2. ස්වභාවික සම්පත් බහුල වීම
3. දේශපාලන ස්ථාවර භාවය 4. බැංකු හා මූල්‍ය ආයතන බිහි නොවීම

29. නූල් කැටීම සඳහා භාවිතා නොකළ යන්ත්‍රයකි,
1. ජෙනී යන්ත්‍රය 2. මියුල් යන්ත්‍රය 3. දුවන නඩාව 4. ජලරාමුව

30. පහත සඳහන් දූත ගමන් අතරින් පළමුවන විමලධර්මසූරිය රජ සමයේ සිදු වූ දූත ගමන මින් කුමක්ද?
1. ජෝන් පයිබර්ස් උඩරටට පැමිණීම 2. ජොරිස් ෆන් ස්පීල්බර්ජන් ගේ පැමිණීම
3. හියුබොයිඩ් උඩරටට පැමිණීම 4. රොබට් ඇන්ඩෲස් උඩරටට පැමිණීම

31. 1848 දෙවන නිදහස් සටනට බල නොපාන ලද බදු වර්ගය මින් කුමක්ද?
1. මුද්දර 2. ඔරු පාරු 3. තුවක්කු 4. පොල්ගස්

32. A හා B තීරු නිවැරදි ලෙස යා කරමින් පිළිතුර සොයන්න.

| | |
|---|---|
| 1. හික්කඩුවේ සුමංගල හිමි | A පානදුරාවාදය |
| 2. වලානේ සිද්ධාර්ථ හිමි | B පරම ධම්ම චේතිය පිරිවෙන |
| 3. රත්මලානේ ධම්මාලෝක හිමි | C මාළිගා කන්දේ විද්‍යෝදය පිරිවෙන |
| 4. මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි | D පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන |

1. CBAD 2. CBDA 3. BCAD 4. DABC

★ පහත සඳහන් තොරතුරු ඇසුරින් 33 හා 34 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A 1 ආණ්ඩුකාරවරයාගේ බලතල
2 ව්‍යවස්ථා දායක සභාව පත්කිරීම

B 1 සීමිත ජන්ද බලය හඳුන්වා දීම
2 උගත් ලාංකිකයා පත්වීම

C 1 සර්වජන ජන්ද බලය ලබාදීම
2 නියෝජිතයන් තෝරාපත් කර ගැනීම

D 1 අගමැතිවරයා
2 අග්‍රාණ්ඩුකාරවරයා

33. පළමු වැන්නේ පාලනය සඳහා දෙවැන්න බිහි වු යුගලය,
1. A 2. B 3. C 4. D

34. පළමු වැන්නාගේ උපදෙස් මත දෙවැන්නා කටයුතු කිරීම, සඳහා වු යුගලය
1. A 2. B 3. C 4. D

35. A විධායක කාරක සභා ක්‍රමය ආරම්භ කිරීම
B රාජ්‍ය නිලධාරීන් තිදෙනා පත් කිරීම

ඉහත තොරතුරු අනුව 1931 ස්වදේශිකයන්ට බලතල ලැබීම සම්බන්ධයෙන්,
1. A හා B අසත්‍ය වේ 2. A හා B සත්‍ය වේ
3. A සත්‍ය වන අතර B අසත්‍ය වේ 4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ

36. මෙරට අධිකරණ පද්ධතිය අනුව දිවයිනේ උත්තරීතර හා අවසාන අධිකරණ බලය හිමි උසාවිය වන්නේ මින් කුමක්ද?
1. ශ්‍රේෂ්ඨාධිකරණය 2. අභියාචනාධිකරණය 3. මහා අධිකරණය 4. දිසා අධිකරණය

37. බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් අමෙරිකාවේ පිහිටුවා ගත් ප්‍රථම ජනපදය මින් කුමක්ද?
1. වර්ජිනියා 2. ජෝර්ජියා 3. ඩෙලවෙයාර් 4. මේරිලන්ඩ්

38. හත් අවුරුදු යුද්ධය නිසා බ්‍රිතාන්‍යයන් විසින් අමෙරිකාවට පනවන ලද පනත් තුනට අයත් නොවන්නේ මින් කුමක්ද?
1. සීනි පනත 2. මුදල් නෝට්ටු පනත 3. මුද්දර පනත 4. දුම්කොළ පනත

39. පළමුවන ලෝක යුද්ධයේදී මිත්‍ර පිලේ රටවල් නියෝජනය නොකරන රට මින් කුමක්ද?
1. ප්‍රංශය 2. මහා බ්‍රිතාන්‍ය 3. රුසියාව 4. ජර්මනිය

40. පහත තොරතුරු ඇසුරින් පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| A ගොබෙල්ස් | E පැසිසිට් වාදය |
| B ගෙස්ටා පෝ | F මුසෝ ලිනි |
| C S.S හමුදාව | G නාසිවාදය |
| D කලු කමිස හමුදාව | H හිට්ලර් |

හිට්ලර්ගේ රහස් පොලිසිය හා ඔහුගේ මාධ්‍ය ඇමතිවරයා පෙන්වන අක්ෂර දෙක වන්නේ,

1. B හා A ය. 2. B හා D ය. 3. C හා D ය. 4. B හා C ය.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 33 | S | II |
|---|---|---|---|---|

**ඉතිහාසය - II** — කාලය පැය තුනයි

I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
II කොටසේ ප්‍රශ්න හතරකටද III කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
⋆ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

(i) ජජ්ජර නදිය, කුරුණෑගල, රයිගම,අරිට්ඨ පබ්බත, මිහින්තලේ, සීගිරි පොතාන, මින්නේරි වැව, රංචාමඩම,මාතලේ අලුවිහාරය, අනුරාධපුරය, සූකරතිත්ත වරාය, මානියම්ගම ( ලකුණු 12 )

(ii) බුරුමය, නාගසාකී නගරය,කොන්ස්තන්තිනෝපල් නගරය, කරිකාල්, මක්කම, රෝමය ( ලකුණු 6 )

(ආ) පහත ABCD යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් / ස්ථාන අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ශ්‍රී මහා බෝධිය රැගෙන සංඝමිත්තා තෙරණිය මෙරටට ගොඩ බසින ලද වරාය කුමක්ද?
B වෙළඳපොළක පාලනය පිළිබඳ හෝපිටිගමු සෙල්ලිපිය කර වූ රජතුමා කවුරුන්ද?
C බ්‍රිතාන්‍ය හත් අවුරුදු යුද්ධයෙන් වැය වූ මුදල උපයා ගැනීම සඳහා නව බදු පනත් යෝජනා කළ බ්‍රිතාන්‍ය අගමැතිවරයා කවුරුන්ද?
D සුවස් ඇළ ජනසතු කළ මිසර ජනාධිපතිවරයාගේ නම කුමක්ද? ( ලකුණු 4 )

● A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) 1. A පිංතූරයෙන් දැක්වෙන පිරිස නම් කරන්න.
2. මෙය කුමන සියවසට අයත් වේද?
3. මෙය දක්නට ලැබෙන ස්ථානය නම් කරන්න.
4. මෙම පිංතූරයෙන් ඉස්මතු වන මූලික අරමුණ කුමක්ද?( ලකුණු 4 )

(ii) 1. B පින්තූරයේ සිටින පුද්ගලයාගේ නම කුමක්ද?
2. ඔහු නියෝජනය කරන රට කුමක්ද?
3. මොහුගේ දේශපාලන මතවාදය හඳුන්වන නම කුමක්ද?
4. මොහු දායකත්වය ලබා දුන්නේ කී වෙනි ලෝක යුද්ධය සඳහාද? ( ලකුණු 4 )


A රූපය


B රූපය

## II කොටස

02. (i) 1. මෙරට ලියවුණු ප්‍රථම වංශ කතාව නම් කරන්න.
2. එදා හෙළදිව ග්‍රන්ථය ලියූ රොබට් නොක්ස් මෙරට සිරකරුවෙකු බවට පත්වූයේ කුමන රජුගේ කාලයේද?
3. මෙරට ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා දේශපාලන තොරතුරු ඇතුළත් ප්‍රධාන මූලාශ්‍රය සඳහන් කරන්න. ( ලකුණු 3 )

(ii) ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ කතෘවරුන් අතර ග්‍රීක කතුවරුන් දෙදෙනෙක් හා රෝම මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 4 )

(iii) මෙරට ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා දේශපාලන තොරතුරු ඇතුළත් ප්‍රධාන මූලාශ්‍රය සඳහන් කරන්න. ( ලකුණු 5 )

(iv) මෙරට පැරණි නටඹුන්, චිත්‍ර, පුරාවස්තු යන මූලාශ්‍ර තුළින් අධ්‍යයනය කළ හැකි තොරතුරු කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 6 )

03. (i) ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන්,

A වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක්,
B පහතරට වියළි කලාපීය ලෙනක්,
C කඳුකර එළිමහන් වාසස්ථානයක් පිළිවෙලින් සඳහන් කරන්න. ( ලකුණු 3 )

(ii) A අවුරුදු 28000 පෙර ගල් මෙවලම් සකසා ගැනීම සඳහා ගල් පතුරු ගලවා ගැනීමට යොදාගත් තාක්ෂණික ක්‍රමය හඳුන්වන නම සඳහන් කරන්න.
B ශුද්‍ර ගල් මෙවලම් සාදා ගැනීමට භාවිත කළ ගල් වර්ගයක් සඳහන් කරන්න.

C මෙසේ සකසන ලද ශුද්‍ර ගල් මෙවලම් සොයාගත් යුගය සඳහන් කරන්න.
D පුරා විද්‍යාඥයින්ගේ අනාවරණයන්ට අනුව මේවායේ සාමාන්‍ය දිග ප්‍රමාණය කොපමණද?( ලකුණු 4)
(iii) පූර්ව ඓතිහාසික යුගයේ තාක්‍ෂණය කරුණු 2 ක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 5 )
(iv) A වාරිමාර්ග ක්‍රම ඇති වීමට හේතු 2ක් සඳහන් කරන්න.
B ගම් වැව් වල පාලනයට පරුමකවරයා දැක්වූ දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 6 )

04. (i) A නගර වුඩික B කන පෙඩික C රූප අදෙක
ඉහත සඳහන් නිලධාරින්ගේ කාර්ය නිවැරදිව පිළිවෙලින් ලියන්න. ( ලකුණු 3 )
(ii) පහත සඳහන් රජවරුන්ට අයත් තොරතුරු පිළිවෙලින් සඳහන් කරන්න.
A වසභ රජුගේ ප්‍රාදේශිය පාලනය පිළිබඳ තොරතුරු සඳහන් වන මූලාශ්‍රය කුමක්ද?
B පණ්ඩුකාභය රජතුමා විසින් ඉදිකරන ලද ප්‍රථම වැව කුමක්ද?
C පළමුවන විජයබා රජතුමාට උදව් කළ දණ්ඩනායක වරයාගේ නම කුමක්ද?
D මහල් නමයකින් යුත් ලෝවා මහාපාය ඉදිකළ රජතුමා ලෙස විරුදාවලිය ලබන්නේ කවුරුන්ද?( ලකුණු 4)
(iii) වසභ රජු රටේ අභ්‍යන්තර පරිපාලනය සඳහා ගන්නා ලද පියවරක් සහ ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා යොමු වූ අවස්ථාවක් සඳහන් කර මෙම කරුණු කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )
(iv) අතීතයේදී ජනතාගේ අත්‍යාවශ්‍ය පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට අතීත රජවරු ගන්නා ලද උත්සාහයන් නිදර්ශන 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු6 )

05. (i) පහත සඳහන් රට වලින් වෙළෙඳාමට පැමිණි විදේශිය ජාතිකයන් හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න.
A මලය අර්ධද්වීපය B ග්‍රීසිය C ඇෆ්ගනිස්ථානය ( ලකුණු 3 )
(ii) මෙරට පැරණි ආගම් සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පහත වරහන තුළින් තෝරා පිළිතුරු ලියන්න.
A වසවසිකසහගයක යනුවෙන් හැඳින්වෙන්නේ,
B මහාවංශ ටීකාවේ සඳහන් පරිදි බ්‍රාහ්මනයින් තම ආගමික කටයුතු කරන ස්ථානය හඳුන්වන නම,
C පැරණිම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථයක් වූ "කිතබ් අල් මස්ලික්වාල් මාමාලික්" කෘතියේ සිරිලක හඳුන්වන නම,
D මා තොට වරාය අසල පිහිටා ඇති හින්දු කෝවිලකි,
( සිවිකා ශාලා, සොත්ථි ශාලා, කඨින චිවරය, කඨින පින්කම, සරන්ඩිබ්, තැප්‍රබේන්, මුන්නේෂ්වරම් කෝවිල, තිරුකේතීෂ්වරම්) ( ලකුණු 4 )
(iii) මෙරට අතීතයේ පැවති තාක්ෂණය පැරණි ගෘහනිර්මාණ ශිල්පය හා වාස්තු විද්‍යාව ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 5 )
(iv) අතීතයේ ශ්‍රී ලංකාවේ සිටි ජන වර්ග සහජීවනයෙන් කටයුතු කළ ආකාරය නිදර්ශන 3 ක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

06. (i) A අනුරාධපුර යුගයේ රජවරු අතරින් මාඝාත නීතිය පැනවූ රජතුමා නම් කරන්න.?
B ශ්‍රී ලංකාවේ දැනට භාවිතාවන නීතිය හඳුන්වන නම සඳහන් කරන්න.
C පැරණි ගම්වල සිටි අපරාධකරුවන් අල්ලා ගන්නා තුරු ඔහු (සොරා) ජීවත් වූ ගමේ වැසියන් විසින් රජයට ගෙවිය යුතු බද්ද හඳුන්වන නම කුමක්ද?
( ලකුණු 3)
(ii) පොලොන්නරුව බිඳ වැටීමට හේතු 4 ක් සඳහන් කරන්න. ( ලකුණු 4 )
(iii) කුරුණෑගල යුගයේ විසූ ශ්‍රේෂ්ඨතම පාලකයා වන සිව් වන පරාක්‍රමබාහු රජුගේ කාර්යය සාපල්‍යතාවය කරුණු 2 ක් ඔස්සේ විස්තර කරන්න. ( ලකුණු 5 )
(iv) දෙවන නාගරීකරණය සමයේ භාෂාව හා සාහිත්‍ය දියුණුව කෝට්ටේ යුගය ආශ්‍රයෙන් කරුණු 3 ක් ඔස්සේ විස්තර කරන්න. ( ලකුණු 6 )


07. (i) පහත සඳහන් වන්නේ මහනුවර යුගයේදී පෘතුගීසි සමඟ සිදු වූ සටන් තුනක වර්ෂයන්ය. එම වර්ෂවල සිදු වූ සටන් හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න.
A - 1594 B - 1630 C - 1638 ( ලකුණු 3 )
(ii) 1833 ක්‍රියාත්මක කරන ලද කෝල්බෘක් ප්‍රතිසංස්කරණ 4 ක් සඳහන් කරන්න. ( ලකුණු 4 )
(iii) සර්වජන ඡන්දබලය යන්න කෙටියෙන් හඳුන්වා එහි වාසි තුනක් සඳහන් කරන්න. ( ලකුණු 5 )
(iv) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ පාර්ලිමේන්තුව සැදුම් ලත් ආකාරය කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 6 )

## III කොටස

08. (i) කාර්මික විප්ලවයේ නව සොයාගැනීම් කිහිපයක් පහත සඳහන්ය. ඒවා සොයාගත් පුද්ගලයන් පිළිවෙලින් සඳහන් කරන්න.
A රූපවාහිනිය B අශ්වයන් බඳින ලද නඟුල් වලින් පේලියට වැපිරීමේ ක්‍රමය
C වර්ෂ 1800 දී ප්‍රථම වරට දකුණු අප්‍රිකාවේ සොයා ගන්නා ලද පොහොර වර්ගය (ලකුණු 3)
(ii) කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ වීමට හේතු 4 ක් සඳහන් කරන්න. ( ලකුණු 4 )
(iii) කාර්මික විප්ලවය නිසා ලෝකයේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් 2 ක් විස්තර කරන්න. (ලකුණු 5)
(iv) "කාර්මික විප්ලවය නිසා ශ්‍රී ලංකාවටද බලපෑම් ඇති විය" ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් මෙරට ප්‍රවාහ, සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයන් තුළ සිදු වූ වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 6 )

09. (i) පළමුවන ලෝක යුද්ධයේ මිත්‍ර පිලට දායකත්වය දැක්වූ රටවල් 3 ක් නම් කරන්න. ( ලකුණු 3 )
(ii) එක්සත් ජාතීන්ගේ සංගමය සැදුම්ලත් වී ඇති ආයතන 4 ක් සඳහන් කරන්න. ( ලකුණු 4 )
(iii) පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට හේතු වූ කරුණු 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 5 )
(iv) 1. A. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අධිකරණය පිහිටි රට හා නගරය සඳහන් කරන්න. (ලකුණු 2)
B. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන කාර්යාලය මහ ලේකම් කාර්යාලයයි. මෙය පිහිටා ඇති නගරය සඳහන් කරන්න. (ලකුණු 1)
2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 3)

(ඇ)(i)



(අ)(ii)



# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# ඉතිහාසය පිළිතුරු පත්‍රය

## 11 ශ්‍රේණිය

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 3 | 31. | 4 |
| 2. | 1 | 12. | 4 | 22. | 4 | 32. | 2 |
| 3. | 1 | 13. | 2 | 23. | 2 | 33. | 1 |
| 4. | 1 | 14. | 4 | 24. | 4 | 34. | 4 |
| 5. | 4 | 15. | 3 | 25. | 4 | 35. | 3 |
| 6. | 4 | 16. | 2 | 26. | 3 | 36. | 1 |
| 7. | 3 | 17. | 2 | 27. | 2 | 37. | 1 |
| 8. | 2 | 18. | 2 | 28. | 4 | 38. | 4 |
| 9. | 2 | 19. | 2 | 29. | 3 | 39. | 4 |
| 10. | 1 | 20. | 3 | 30. | 2 | 40. | 1 |

II කොටස

01. (අ) (i) ලංකා සිතියමෙහි ඇත.
(ii) ලෝක සිතියමෙහි ලකුණු කර ඇත.

(ආ) (i) A දඹකොළ පටුන  B 4වන උදය රජු  C ජෝර්ජ් ග්‍රැන්විල්  D අබ්දුල් ගමාර් නසාර්

(i) 1. ප්‍රනීත ආහාර බුදින පිරිසක්  2. 19 වන සියවසට  3. මුල් ගිරිගල  4. පරිසරයෙන් ලබා ගත් පිරිසිදු ආහාර ශරීර සෞඛ්‍යයට හිතකර බව.

(ii) 1. බෙනිටෝ මුසෝලිනී / මුසෝලිනි  2. ඉතාලිය  3. පැසිට්වාදය  4. දෙවන ලෝක යුද්ධයට

02. (i) 1. දීපවංශය  2. දෙවන රාජසිංහ රජු  3. රාජාවලිය

(ii) I ග්‍රීක - ඇරිස්ටෝටල්, මෙගස්තිනිස්, ඔනෙසි ක්‍රිටස්
II රෝම මූලාශ්‍ර - නැචුරාලිස් හිස්ටෝරියා, භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, ටොලමිගේ ලංකා සිතියම හා නිවැරදි පිළිතුරු

(iii) වෙළඳාම 4 වන උදරජුගේ - හෝපිටිගමු (බදුලු) ඇතුළත්
නීතිරීති -★ වෙළඳපොල පසුකරගෙන යන කරත්ත වලින් බදු අය නොකර ගැනීම
★ බුලත් විකිණීමට මඩුවක් ගැසීම සිදු කළ යුතු වීම
★ හොර කිරුම් මිනුම් භාවිතා නොකිරීම
★ පොහොය දිනට වෙළදාම් නොකිරීම
★ නිලධාරින්ට නොපෙන්වා බඩු විකිණීම කළ විට දෙගුණයක් බදු අය කිරීම

අපරාධ නිතීය - හතරවන මිහිඳු රජුගේ වේවැල්තැටිය සෙල්ලිපිය
★ සොරකම් කිරීම, මිනී මැරීම දඩුවම් විස්තර කර ඇත. මිනී මැරීමට දඩුවම එල්ලා මැරීම වේ.
★ හරක් හොරුන්ට දෙන දඩුවම නලලේ හංවඩු තැබීම
★ ගම් වැසියන් ගෘහ දණ්ඩ බද්දට හසු වීම වැනි අදාළ කරුණු

(iv) I නටඹුන් - නිර්මාණාත්මක හැකියාව, තාක්ෂණය, වාස්තු විද්‍යාව, ගොඩනැගිලි නිර්මාණය කෙසේ සිදුවීද යන්න හඳුනා ගැනීම. මහල් නිවාස, පාදම්, රජමාළිගා, බිසෝකොටුව, වැනි අදාළ තොරතුරු දැන ගැනීම

II චිත්‍ර - අතීත මිනිසුන්ගේ ඇඳුම් පැළඳුම්, කලා කුසලතා, ආභරණ පරිහරණය, වර්ණ භාවිතය, ආගමික විශ්වාස, රූපලාවන්‍ය මෝස්තර ආදිය හඳුනා ගැනීම.

III පුරා වස්තු - ජනතාවගේ විවිධ හැකියා, කුසලතා, පැරණි සංස්කෘතිය, තාක්ෂණය, විදේශ සබඳතා හා ඔවුන්ගේ ජිවන ක්‍රමය පිළිබඳ අවබෝධය ලබා ගත හැකි වීම ආදී කරුණු

03. 1. A මිනිසා ගල් කන්ද/ බුන්දල / පතිරාජවෙල
B සීගිරිපොතාන / අලිගල
C බණ්ඩාරවෙල / හෝර්ටන් තැන්න

2. A ශල්කන පීඩනය  B තිරිවාන/ බිම්වීදුරු/ කහඳපාෂාණ/ කලුගල් හෙවත් ග්‍රැනයිට්

3.මැටි බඳුන් තාක්‍ෂණය
★ මැටි සොයා ගැනීම
★ මැටි අනා ගැනීම
★ සකපෝරුව භාවිතා කොට මැටි බඳුන් නිර්මාණය
★ පිළිස්සීම සඳහා උඳුනක් සාදා ගැනීම
★ සායම් සකසා ගැනීම
★ පින්තාරු කිරීම

නිවාස තාක්‍ෂණය
★ ආයත චතුරශ්‍රාකාර බිම
★පොළවට ලම්භකව බිත්ති බැඳිම
★ ගිලා නොබසින ලෙස බිම සකසා ගැනීම
★ නිවාසය දෙකට බෙදා තිබීම
★ වහලය සෙවිලි කර තිබීම
★ උළුවස්සක් සවිකර තිබීම
★ උඩරංචා මඩමෙන් තොරතුරු හමුවීම

ක්‍රමවත් සුසාන
- ● මැටි ඔරු
- ★ පොළවට ලම්භකව බිත්ති බැඳීම
- ★ වාතය ලබා ගැනීම සඳහා මැටි බට සවි කර තිබීම ආදී අදාළ තොරතුරු
- ● ලෝහ තාක්‍ෂණය
- ★ ලෝහ නිස්සාරණ ක්‍රම
- ★ සීගිරිය අලකොළ වැව හා බලංගොඩ සමනල වැව ආශ්‍රිතව දෙකකට ලෝහ නිස්සාරණය, උෂ්ණත්වය 1538

දර වර්ග, යොදා ගත් ගල් වර්ග ලිමොනයිට් හා හෙමටයිට්, දල්වන වේලාව අඛණ්ඩව පැය 12ක් ආදී තොරතුරු

4. A ★ ජනගහනය වැඩි වීම ★ වර්ෂාව අවිනිශ්චිත වීම ★ ගංගාවල ජලය ප්‍රමාණවත් නොවීම
★ ප්‍රධාන ආහාරය බත් වීම ★ වර්ෂාව එක් කාලයකට පමණක් ලැබීම ආදී අදාළ කරුණු

B ★ ගම්කයන්ගෙන් වඩා බලවත් පුද්ගලයා පරුමකවරයන් ලෙස තෝරා ගැනීම
★ ජනගහනය වැඩි වීමත් සමඟ වැව් පාලනයට පුද්ගලයෙකු අවශ්‍ය වීම
★ ගම් නායකයන් අතර සාකච්ඡා කිරීම
★ පොදු තීරණ ගැනීම
★ වැව් පද්ධතිය නඩත්තුවට තීරණ ගැනීම ★ ජලය සංරක්‍ෂණය වැනි තීරණ ගැනීම

04. (i) A නගරයේ වාස්තු ශිල්පියා
B රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී ( රාජ්‍ය ලේඛන පිළිබඳ කටයුතු කරන්නා )
C කාසි අච්චු ගැසීමේ නිළධාරියා

(ii) A වල්ලිපුරම් රන් සන්නස
B අභය වැව/ බසවක්කුලම වැව
C සිත්තාරු බිම් බුදල්නා / බුද්ධරාජ
D දුටු ගැමුණු රජු

(iii) අභ්‍යන්තර පරිපාලනය - ★ ප්‍රාදේශීය පාලනයක් ඇති කිරීම
★ ඉසිරි සාමන්ත වරයා පත්කොට තිබීම
★ රට හැමතැනම සෙල්ලිපි තිබීම ( කුරුණෑගල, මඩකලපුව,තිස්සමහාරාමය වැනි )
★ බදු ආදායම ක්‍රමවත් කිරීම වැනි කරුණු අදාළ වේ.

ජාත්‍යන්තර සබඳතා - ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගංගාවේ ඇති වූ ආහාර හිඟයට පිළියම් යෙදීමට කටයුතු කිරීම හා මහවැව් ආරම්භය උදා- මහවිලච්චිය, මහා කැටිය වැනි වැව් ඉදි කිරීම
★ විශාල ප්‍රමාණයේ වැව් 16 ක් ඉදි කිරීම

(iv) වෙජ - වෛද්‍යවරු, වෙජවෙජ්ජශාලා, රෝහල් තිබූ බව
★ බුද්ධදාස රජු රෝහල් ඉදිකිරීමට කටයුතු කිරීම
★ පලමුවන උපතිස්ස රජු විසින් ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා පසවන්ති නාම ශාලා ඉදි කිරීම
★ අනුරාධපුරයේ ඇති වූ උණ රෝගයට පිළියම් ලෙස උපසග්ගරෝග නාස නමින් වෙනම රෝහලක් 4 වන කාශ්‍යප රජු විසින් ඉදිකර දීම
★ එමෙන්ම රෝහල් වලට අවශ්‍ය සියලු පහසුකම් පස් වැනි මිහිඳු රජු විසින් ලබා දීමට කටයුතු කිරීම, ඊට අමතරව වෙදපොත්, වෛද්‍ය උපකරණ, බෙහෙත් ඔරු, ආලාහන පිරිවෙනේ රෝහලේ නටඹුන්
මිහින්තලේ රෝහලේ නටඹුන් ආදී ඕනෑම කරුණු සඳහා ලකුණු ලබා දෙන්න.

05. (i) Aජාවකවරු Bඅයෝනියන්වරු Cකාම්බෝජවරු

(ii) Aකඨින චීවරය Bසොත්ති ශාලා Cතැප්‍රබේන් Dතාරුකේතීෂ්වරම්

(iii) ★ වාස්තු විද්‍යාවට අයත් වන දෑ, බෞද්ධ ගොඩනැගිලි, දාගැබ්, බෝධිඝර පිළිම ගෙවල්, විහාර ගෙවල්, ආරාම, දානශාලා, භාවනා භූමි වැනි දේ
★ රුවන්වැලිසෑයේ අකුණු සන්නායකය පිළිබඳ විස්තර
★ රුවන්වැලිසෑයේ පාදම පිළිබඳ විස්තර
1. රියන් හතක් පොළොව හාරා පස් ඉවත් කර හුණුගල් කැබලි දමා අලියන් ලවා හම් සපත්තු දමා පෑගවීම
2. වෙඩරු මැටි, ගල් තට්ටුවක්, බොරළු තට්ටුවක්, පළිඟු ගල් තට්ටුවක්, නවනීත මැටි එක උඩ එක ඇතිරීම
3. දිවුල් මැලියම් සහිත ලෝහ දැලක් ඊට උඩින් එලීම
4. තල තෙලින් පොඟවා ගන්නා ලද රන් ගල් ඇතිරීම
★ ආලාහන පිරිවෙනේ රෝහලේ බිම් සැලැස්ම පිළිබඳ විස්තර
★ ලෝවාමහාපාය පිළිබඳ විස්තර
★ අනුරාධපුරය ගල් පාලම වැනි අදාළ පිළිතුරු සඳහා

(iv) ★ අම්පාරේ සිංහල කාන්තාවන් දෙමළ කෙනෙකු සමඟ විවාහ වීම
★ අනුරාධපුරයේ දෙමළ ජනතාව විසූ වීදියක් තිබීම
★ අභයගිරි සෙල්ලිපියට අනුව දෙමළ භික්ෂුවක් ශාසනයේ පැවිදිව සිටීම
★ අගම්පඩි හමුදාව දළඳාව ආරක්ෂා කිරීම
★ සුලෙයිමාන් සංචාරකයා ආදම්ගේ කන්ද වන්දනා කිරීම
★ දෙමේල් අධිකාරි පඩිරාද් නැමැත්තෙන් (නිලයක්) දෙමළ අයගේ සුභසාධන කටයුතු සිදු කිරීම වැනි අදාළ කරුණු

06. (i) A අමණ්ඩ ගාමිනි අභය රජු B රෝම ලන්දේසි නීතිය C ගෘහ දණ්ඩ බද්ද

(ii) 1. දුර්වල පාලකයන් බලයට පත් වීම 2. කාලිංග පාණ්ඩ්‍ය වංශික බල අරගලය
3. කාලිංග මාඝගේ පැමිණීම 4. ආර්ථික පරිහානිය

(iii) 1. දළඳා සිරිත, දළඳා පූජාවලිය, දළඳාවට ගම්වර පිදීම, දළඳා මන්දිරයක් ඉදි කිරීම හා නඩත්තු එහි කටයුතු පවත්වාගෙන යාම

2. සිංහල බෝධි වංශය, අනාගත වංශය, පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය සඳහා අනුග්‍රහය දැක්වීම

3. බුදු දහමේ උන්නතියට කටයුතු කිරීම, පිරිවෙන් සඳහා අනුග්‍රහය දැක්වීම (වත්තල විජයබා පිරිවෙන හා ගනානන්ද පිරිවෙන)

4. අස්ගිරි සේනාසනයට අනුග්‍රහය දැක්වීම, වැනි අදාළ කරුණු

(iv) ⋆ 6 වන පරාක්‍රමබාහුගේ අනුග්‍රහය ලබා දීම ⋆ ඔහුද සාහිත්‍යකාමියෙක් වීම.

⋆ ගිහි හා උගත් පඬිවරු සිටීම

ගිහි - රාමචන්ද්‍ර භාරතී, නන්නුර්තුනෙයියාර්, 6 වන පරාක්‍රමබාහු රජු

පැවිදි - තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්, විදාගම මෛත්‍රී හිමියන්, කැරගල වනරතන හිමි වැනි උගත් දායකත්වය

⋆ අධ්‍යාපන මධ්‍යස්ථාන දියුණු වී තිබීම ( පිරිවෙන් - ගනානන්ද පිරිවෙන, ඉරුගල් කුලතිලක පිරිවෙන, විජයබා පිරිවෙන, පැපැලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන )

⋆ විවිධ සාහිත්‍ය වර්ග බිහි වීම. ● සිලෝකාව්‍ය, උපදේශන කාව්‍ය, භක්ති කාව්‍ය, සංදේශ කාව්‍ය, හටන් කාව්‍ය කෝෂ ග්‍රන්ථ.

⋆ සංදේශ කාව්‍ය - පරවි, ගිරා, සැලලිහිණි, කොවුල්, හංස සන්දේශ

07. (i) A දන්තුරේ සටන B රන්දෙනි වෙළ සටන C ගන්නෝරුව සටන

(ii) 1. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම 2. උඩරට, පහතරට එක්කරමින් ස්ථිර පාලනයක් ගෙන යාම 3. පළාත් 5 ක් ඇති කිරීම 4. ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම

5. ව්‍යවස්ථාදායක සභාව හා විධායක සභාවන් පත් කිරීම

6. සිවිල් නිලධාරින්ගේ වැටුප හා විශ්‍රාම වැටුප අහෝසි කිරීම

7. ගම් සභාව අහෝසිකර නගර තුළ අධිකරණ පද්ධතියක් ඇති කිරීම වැනි අදාළ තොරතුරු සඳහා

(iii) I 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ උගත් නුගත් භේදයකින් තොරව, දුප්පත් පොහොසත් බේදයකින් තොරව ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව,

අවුරුදු 21 ට වැඩි සියලු දෙනාට


ඡන්ද බලය හිමි වීම

II ⋆ කැමති පාලකයන් පත් කර ගැනීම ⋆ අකැමති පාලකයන් ඉවත් කර ගැනීම (පසු ඡන්දයෙන් )

⋆ ජනතාවගේ අදහස් පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක කරවීම

⋆ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම වැනි අදාළ තොරතුරු සඳහා

(iv)




⋆ මණ්ඩල දෙකින් සමන්විත වීම

⋆ මහජන මන්ත්‍රී මණ්ඩලය 101 ක් වීම

⋆ එයත් 95 දෙනෙක් පළාත් ඡන්ද කොට්ඨාශ මත තෝරා පත් කර ගැනීම

⋆ සුළු ජන වර්ග සඳහා 6 අගමැතිගේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා විසින් පත් කිරීම

⋆ පළාත් ඡන්ද කොට්ඨාශ මත තෝරා ගත් 95 දෙනා වෙනුවෙන් සෙනෙට් සභාවට 15 දෙනෙකු තෝරා ගැනීම

⋆ අගමැතිගේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා විසින් ඉතිරි 15 දෙනා තෝරා ගැනීම

08. (i) ජෝන් ලොගී බෙයාඩ් B ජේන් රෝටල් C ගුවානෝ පොහොර

(ii) ⋆ සම්පත් බහුල වීම ⋆ ධනවතුන් සිටීම (මුදල් ආයෝජනය කළ හැකි)

⋆ දේශපාලන ස්ථාවරභාවය ⋆ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය

⋆ දුපත් රාජ්‍යයන් වීම ⋆ නිදහස් වෙළඳ ප්‍රතිපත්ති ⋆ ප්‍රවාහන පහසුව ආදී අදාළ තොරතුරු

ගැළපෙන පරිදි ලකුණු ප්‍රදානය කරන්න.

(iii) වෙළඳාම දියුණු වීම, ධනපති පන්තියක් හා නිර්ධන පන්තියක් බිහි වීම, ඉඩම් අතහැර ගොවියන්ට නගරයට යාමට සිදු වීම, ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටීම, වැටුපට වැඩ කරන කම්කරු පිරිසක් බිහි වීම, ආනයන අපනයන වෙළඳ ආර්ථිකය දියුණු වීම, කෘෂි නිෂ්පාදන කටයුතු දියුණු වීම, වෙළඳ තොග ඇති වීම, ධනවාදී ආර්ථික රටාව ලොව ප්‍රබල වීම, බද්ධ ව්‍යාපාර බිහි වීම, බැංකු ක්‍රම ඇති වීම හා දියුණු වීම, ආදී අදාළ තොරතුරු සඳහා ලකුණු ප්‍රදානය කරන්න.

(iv) ප්‍රවාහන - මහාමාර්ග, එඩ්වඩ් බාන්ස් දුම්රිය මාර්ග - හෙන්රි වෝඩ් මැකඩම් ක්‍රමය

සමාජ ක්‍රමය - ඉන්දියානු කම්කරු පන්තිය, මධ්‍යම පාන්තිකයන්ගේ පැමිණීම, ඉංග්‍රීසි අධ්‍යාපනය කතෝලික ආගම් ප්‍රචාරණය, සිරිත් විරිත් වෙනස් වීම

ආර්ථික - වතුවගාව දියුණු වීම, ( තේ, රබර්, කෝපි, කොකෝවා) ධනවතුන් බිහිවීම නිර්ධන පන්තියක් බිහිවීම , ධනපතින් සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීම වෙළෙඳාම දියුණු වීම, යන්ත්‍ර සූත්‍ර බිහිවීම, ආදී අදාළ තොරතුරු සඳහා ලකුණු ප්‍රදානය කරන්න.

09. (i) බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, ඉතාලිය, සර්බියාව, ග්‍රීසිය, රුමේනියාව

(ii) මහා මණ්ඩලය, ආරක්ෂක මණ්ඩලය, ආර්ථික හා සමාජීය මණ්ඩලය, භාරකාර මණ්ඩලය, ජාත්‍යන්තර අධිකරණය, මහා ලේකම් කාර්යාලය

(iii) 1. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේදී ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත් වීම

2. දෙවන විලියම්ගේ ක්‍රියාකලාපය 3. යටත් විජිත සඳහා වූ තරඟය

4. අවිතරගය සහ ජාතිවාදය වර්ධනය වීම

5. ප්‍රංශය යුරෝපය තුළ තනි කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය

6. ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුගේ ඝාතනය කරුණු දෙකක් විස්තර කිරීම අවශ්‍යය.

(iv) 1. A රට - නෙදර්ලන්තය, නගරය - හේග්නුවර B. නිව්යෝක් නගරය.

2. ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ගැටුම් පරීක්ෂා කර සාමකාමීව විසඳීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම, කිසියම් ආක්‍රමණිකියෙකුට විරුද්ධව ආර්ථික සම්බාධක පැණවීම, අවශ්‍ය නම් යුද බලය යෙදවීමත් මෙහි වැදගත් ක්‍රියාමාර්ග වේ, නිත්‍ය සාමාජික රට වලින් නිශේධ බලය යොදා ඕනෑම යෝජනාවක් නිෂ්ප්‍රභ කළ හැකිවීම යනාදී කරුණු.

